# බිම් මට්ටමින් බහු ආපදා පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති මඟින් කොවිඩ්-19 ඇතුළු අනෙකුත් වසංගත පිළිබඳ පෙර සූදානම වැඩි දියුණු කිරීම

**වර්තමානයේ බොහෝ රටවල් වසංගත සඳහා පූර්ව සූදානම් වීම අත්‍යවශ්‍ය බව හඳුනාගෙන තිබේ. ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් කොවිඩ්-19 ගෝලීය වසංගතයක් ලෙස ප්‍රකාශ කිරීමත් සමග එහි බලපෑම සහ අවධානම සෞඛ්‍ය අංශයට පමණක් සීමා නොවී අනෙකුත් අංශ කරාද පැතිරීගිය බව පැහැදිලි වේ. කොවිඩ් වසංගතයේ බලපෑම ශ්‍රී ලංකාවේ සමාජ-ආර්ථික බිඳවැටීම් කෙරෙහිද දැඩි ලෙස බලපා තිබේ. විශේෂයෙන් සංචාරක ව්‍යාපාරය, කෘෂිකර්මය, ඇඟළුම් කර්මාන්තය සහ සේවා යන අංශ වල සිදු වූ පසුබෑම හේතුවෙන් පළමු කොවිඩ් රැල්ල අවසන් වන විට පමණක් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට රුපියල් බිලියන 900 ක් පමණ අහිමිවන්නට ඇතැයිද, එම මුදල දළ දේශීය නිෂ්පාදිතයෙන් 6%ක ප්‍රමාණයක් වන බවටද ඇස්තමේන්තු කර තිබේ.**

**දැනට පවතින කොවිඩ් 19 ඇතුළු අනෙකුත් ජීව විද්‍යාත්මක ආපදාවන් අවම කිරීමේ ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග අප රටේ ආපදා අවම කිරීමේ උපාය මාර්ගයන් වැඩි දියුණු කර ගැනීමේ අවශ්‍යතාව මතු කර තිබේ.**

- වසංගතයේ කෙටිකාලීන බලපෑම් වැලැක්වීම සඳහා ගනු ලැබූ ආරක්ෂිත පියවරයන් රට තුළ දීර්ඝකාලීන පූර්ව සූදානම සඳහා පරිවර්තනය කිරීමට ප්‍රමාණවත්ද?
- ජනාකීර්ණ සහ අවම සම්පත් සහිත වටපිටාවක ජීවත්වන අඩු ආදායම් ලාභීන්, අවතැන්වූවන් සහ අනෙකුත් අවම වරප්‍රසාද ලැබෙන ප්‍රජාවගේ අවදානම දිගුකාලීනව විසඳීමට ගතහැකි ක්‍රියාමාර්ග කවරේද?
- කොවිඩ් වසංගතයට සමගාමීව වෙනත් ස්වභාවික හෝ ජීවවිද්‍යාත්මක ආපදාවක්/න් සිදු වුවහොත් එවැනි බහු ආපදා තත්වයකට මුහුණදීමට අප සූදානම්ද?
- මෝසම් වර්ෂාවත් සමග හිස ඔසවන ඩෙංගු රෝගයේ සහ අනෙකුත් වසංගත වල ව්‍යාප්තියත් සමග කොවිඩ් මර්ධන වැඩසටහන් නිසිපරිදි සංවිධානය කරගන්නේ කෙසේද?
- සුනාමි වැනි ස්වභාවික ආපදා අවස්ථාවකදී ප්‍රජාව ආරක්ෂිත ස්ථානයකට ඉවත්කිරීම වැනි ක්‍රියාමාර්ග වලට පවතින වසංගත තත්වයත් සමග මුහුණ දීමට දැනට පවතින උපක්‍රම කවරේද? එවැනි අවස්ථාවක දැනට පවතින අනතුරු ඇඟවීමේ සේවා සහ ප්‍රතිචාර දැක්වීමේ ක්‍රියාවලීන් වැඩිදියුණු කළ හැක්කේ කෙසේද?





**මෙම ගැටලුවලට නිවැරදි ආකාරයෙන් ප්‍රතිචාර දැක්වීමට නම්,**

- සෙන්ඩායි රාමුව තුළ යෝජිත එහෙත් ප්‍රශස්ථ මට්ටමින් ක්‍රියාත්මක නොවූ බහු ආපදා අවදානම් අවම කිරීම පිළිබඳ ජාතික සහ ප්‍රාදේශීය මට්ටමේ උපායමාර්ගයන් තුළට **වසංගත අවම කිරීමේ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග** අන්තර්ගත කල යුතුය.
- ආපදා තක්සේරු කිරීම, රාජ්‍ය මූල්‍ය, වාණිජ සහ සමාජීය නිර්දේශ සම්බන්ධීකරණය කිරීම, උගත්පාඩම් සහ භාවිතයන් හුවමාරු කර ගැනීම වැනි වැඩසටහන් සාමූහිකව අධ්‍යනය කිරීම සඳහා විවිධ පාර්ශවකරුවන් සම්බන්ධකරගත් ප්‍රවේශයක් නිර්මාණය කලයුතුය.

## එබැවින් පහත දැක්වෙන අරමුණු සඳහා ක්‍රියාත්මක වීම අපගේ ඉලක්කයයි.

1. කොවිඩ් 19 ඇතුළු අනෙකුත් ගෝලීය වසංගත සඳහා අනතුරු ඇඟවීමේ සහ තොරතුරු බෙදා හැරීමේ ක්‍රියාවලියට **අදාළ ක්‍රියාමාර්ග** සහ ඊට සම්බන්ධ වන **ප්‍රධාන පාර්ශවකරුවන්** හඳුනාගැනීම.
2. ජාතික සහ ප්‍රාදේශීය මට්ටමේ ආපදා අවම කිරීමේ ක්‍රියාමාර්ගයන් තුළට කොවිඩ් 19 සහ අනෙකුත් වසංගත අවමකිරීම සඳහා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම.
3. කොවිඩ් 19 හේතුවෙන් නිර්මාණය වූ ද්විත්ව බලපෑම නිසා දැනට පවතින පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතියෙහි දැඩි බලපෑමක් සිදු වී ඇත්තේ කුමන අංශ වලටදැයි විමර්ශනය කිරීම.
4. බහු ආපදා තත්ත්වයකදී, ආපදාවන්ට ප්‍රතිචාර දැක්වීමේ ශක්‍යතාවයන්ට කොවිඩ් 19 වසංගතය මගින් ඇති කරනු ලබන බලපෑම හඳුනාගැනීම
5. බිම් මටමේ බහු ආපදා පූර්ව අනතුරු ඇඟවීමේ ක්‍රියාවලිය සමග මහජන සෞඛ්‍ය ක්‍රියාකාරීන් සම්බන්ධ කිරීමේ හැකියාව පිළිබඳ සොයා බැලීම.
6. ආපදා තත්වයකදී ඇතිවෙන අවිනිශ්චිතතාවයන්ට මුහුණ දීමේදී තාවකාලික වාසස්ථාන හා කදවුරු පවත්වා ගෙන යෑම, ප්‍රජාව ආරක්ෂිත ස්ථානවලට ඉවත්කිරීම වැනි ක්‍රියාමාර්ගවලට, වසංගත සඳහා ප්‍රතිචාර දැක්වීමේ උපක්‍රම කෙබඳු බලපෑමක් ඇති කරන්නේද යන්න හඳුනාගැනීම.
7. ප්‍රජා සම්බන්ධතා, සන්නිවේදන ක්‍රම සහ පුරවැසි චර්යාවන්ද උපයෝගී කරගෙන ප්‍රජා මට්ටමින් ක්‍රියාත්මක වන පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතියට කොවිඩ් 19 සහ අනෙකුත් වසංගත සඳහා වූ ආවේක්ෂණ පද්ධතියක් ඇතුලත් කිරීමට යෝජනා ඉදිරිපත් කිරීම.

## අපේක්ෂිත ප්‍රතිඵල

1. කොවිඩ් 19 ඇතුළු අනෙකුත් වසංගත පිළිබඳ අනතුරු ඇඟවීමේ සහ තොරතුරු බෙදාහැරීමේ ක්‍රියාවලියට අදාළ ප්‍රධාන පාර්ශවකරුවන් සහ ක්‍රියාමාර්ග ඇතුලත්ව සංකල්පීය රාමුවක් ගොඩ නැගීම.
2. මහජනතාව දැනුවත් කිරීම සඳහා අවශ්‍ය විවිධ මට්ටමේ සාකච්ඡා සහ දැනුවත්කිරීමේ වැඩසටහන් ක්‍රියාවට නැගීම.
3. ආපදා අවමකිරීම පිළිබඳ ජාතික සහ ප්‍රාදේශීය ප්‍රතිපත්ති තුළට වසංගත අවමකිරීමේ උපායමාර්ග ඇතුළත්කිරීම, කාලීන තොරතුරු සහ නිර්දේශ සහිත පර්යේෂණ ලිපි ශාස්ත්‍රීය වශයෙන් පිළිගත් සඟරාවල පළ කිරීම සහ ඒ අනුසාරයෙන් ප්‍රතිපත්තිමය වෙනස්කම් පිළිබඳ සංවාදයකට අවතීර්ණ වීම.
4. වසංගත අවම කිරීම බහුආපදා පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතියට සංකලනය කිරීමේ ප්‍රවේශය පිළිබඳ මාර්ගෝපදේශන පත්‍රිකාවක් සකස්කිරීම.
5. ප්‍රධාන පෙළේ ජාත්‍යන්තර පර්යේෂණ සැසිවාරයන්හි දී යාවත්කාලීන කරන ලද පර්යේෂණ දත්ත සහ සොයාගැනීම් ඉදිරිපත් කිරීම.
6. ව්‍යාපෘති ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු ව්‍යාපෘති අත්පත්‍රිකා සහ බහුමාධ්‍ය හරහා ප්‍රකාශයට පත් කිරීම.



## මෙම ව්‍යාපෘතිය මගින් අපේක්ෂිත ගෝලීය සහ ජාතික මට්ටමේ දායකත්වය

- ශ්‍රී ලංකාව සහ කලාපීය රටවල් වසංගත තර්ජන හේතුවෙන් ආපදා සඳහා සූදානම් වීමේදී, ප්‍රතිචාර දැක්වීමේදී සහ යථා තත්වයට පත්කිරීමේදී මුහුණ දෙන අභියෝග අවම කර ගැනීම සඳහා සහය වීම.
- එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල සුනාමි උවදුරු තක්සේරු කිරීම සහ පූර්ව සූදානම හා ධාරිතාව සංවර්ධනය සඳහා පෙළඹවීමට පර්යේෂණ මගින් මගපෙන්වීම සහ ඒ සඳහා යුනෙස්කෝව සහ සුනාමි අනතුරු ඇඟවීම සහ අවම කිරීම පිළිබඳ අන්තර් රාජ්‍ය සම්බන්ධීකරණ කණ්ඩායමට සහයවීම.
- පර්යේෂණ ප්‍රතිඵල හරහා අනෙකුත් ආපදා සඳහා ප්‍රතිචාර දැක්වීමේදී, කොවිඩ් වසංගතයෙහි බලපෑම පිළිබඳ ජාතික සහ ප්‍රාදේශීය මට්ටමේ පාර්ශවකරුවන්ගේ අවබෝධය සහ ආකල්ප වැඩිදියුණු කිරීම සඳහා කටයුතු කිරීම.
- තිරසාර සංවර්ධන අරමුණු (SDG) බලාත්මක කිරීම සඳහා විශේෂයෙන් පාරිසරික ක්‍රියාමාර්ග (13), තිරසාර නගර සහ ප්‍රජාවන් (11) සහ අසමානතාවය අවමකිරීම සඳහා වූ සම්මත ක්‍රියාකාරකම් පටිපාටි (10) වැඩිදියුණු කිරීමට අවශ්‍ය තීරණ ගැනීම සඳහා ජාතික සහ ප්‍රාදේශීය මටටමේ ක්‍රියාකාරීන් පෙළඹවීම.

### ව්‍යාපෘතිය මෙහෙයවීම සහ ප්‍රධානත්වය

University of HUDDERSFIELD
Inspiring global professionals

හඩර්ස්ෆීල්ඩ් විශ්වවිද්‍යාලය, එක්සත් රාජධානිය

### ප්‍රධාන පාර්ශවකරුවන් සහ විමර්ශකයින්

කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

මොරටුව විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

සෞඛ්‍ය අමාත්‍යාංශය, ශ්‍රී ලංකාව

### අනෙකුත් ව්‍යාපෘති සහකරුවන්

DMC SRI LANKA · FSLGA · ADRiMP · adpc · GMCA GREATER MANCHESTER COMBINED AUTHORITY · Public Health England · UNDRR UN Office for Disaster Risk Reduction · United Nations Educational, Scientific and Cultural Organization · Intergovernmental Oceanographic Commission

## මූලික සබැඳුම්


- ව්‍යාපෘති විධායක ප්‍රධානී: **මහාචාර්ය ඩිලන්ති අමරතුංග** (d.amaratunga@hud.ac.uk) හා **මහාචාර්ය රිචඩ් හේග්** (r.haigh@hud.ac.uk)
  ආපදා ප්‍රත්‍යස්ථාව පිළිබඳ ජාත්‍යන්තර මධ්‍යස්ථානය, ව්‍යවහාරික විද්‍යා පීඨය, හඩර්ස්ෆීල්ඩ් විශ්වවිද්‍යාලය, එක්සත් රාජධානිය
- ව්‍යාපෘති ප්‍රධානී: ශ්‍රී ලංකා සෞඛ්‍ය අමාත්‍යාංශය
  **වෛද්‍ය හේමන්ත හේරත්** (hdbher@gmail.com)
- ව්‍යාපෘති ප්‍රධානී: කොලඹ විශ්ව විද්‍යාලය
  **ආචාර්ය නිශාර ප්‍රනාන්දු** (nishara.fernando@gmail.com)
- ව්‍යාපෘති ප්‍රධානී: මොරටුව විශ්ව විද්‍යාලය
  **ආචාර්ය චන්දන සිරිවර්ධන** (chandanasiriwardana@gmail.com)



අයිතිය අත් හැරීමේ ප්‍රකාශය: නියාමනයේ හා කොන්දේසිවල සඳහන් වන ආකාරයට හෝ අනෙකුත් ආකාරයකට ලිඛිතව එකඟ වූ අවස්ථාවලදී හැර මෙම පර්යේෂණ ව්‍යාපෘතිය මගින් පැන නැගිය හැකි මූල්‍යමය හෝ අනෙකුත් වගකීම් සඳහා එක්සත් රාජධානි පර්යේෂණ හා නවෝත්පාදන වැඩසටහන් වග නොවනු ඇත.

UK Research and Innovation · EPSRC Engineering and Physical Sciences Research Council · GCRF Global Challenges Research Fund · Newton Fund